DOI: 10.31357/fhssmst.2007.00056

# සබරගමු යක් තොවිල්වල විග්‍රහ වන ලිංගික නිරූපණ

ජේ.එම්.ආර්.සී. බණ්ඩාර

ශාස්ත්‍රපති 2007

# සබරගමු
# යක් තොවිල්වල විග්‍රහ වන
# ලිංගික නිරූපණ

ජයසිංහ මුදියන්සේලාගේ රුවන්සිරි චින්තක බණ්ඩාර
ලේඛ්‍යාරූඪ අංකය :- GS/HU/1525/2002

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිංහල හා ජනසන්නිවේදන
අධ්‍යයනාංශයේ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය සඳහා
ඉදිරිපත් කෙරෙන නිබන්ධයයි.

## අයදුම්කරුගේ ප්‍රකාශය

මෙම නිබන්ධය සඳහා අදාළ පර්යේෂණ කටයුතු ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තිස්ස කාරියවසම් මහතාගේ උපදේශකත්වය යටතේ සිදු කළ බව ද සමස්ත නිබන්ධය හෝ එයට අයත් කොටස් හෝ කිසිම අයුරකින් වෙනත් විශ්වවිද්‍යාලයක ආයතනයක පරීක්ෂණයක් සඳහා ඉදිරිපත් කොට නැති බව ද සහතික කරමි.

දිනය ඃ

අයදුම්කරු

ජේ.එම්.ආර්.සී. බණ්ඩාර

## උපදේශකගේ සහතිකය

අයදුම්කරු විසින් ඉහත සඳහන් කරන ලද ප්‍රකාශය සත්‍ය බව ද ඇගයීම් සඳහා මෙම නිබන්ධය විශ්වවිද්‍යාලය වෙත ඉදිරිපත් කිරීමට සුදුසු බව ද සහතික කරමි.

දිනය : 23/01/07

උපදේශක.

24 JAN 2007

## උපකාරානුස්මෘති

අප වැනි දුහුනන් මෙවැනි නිබන්ධිකාවක් සම්පාදනය කරනු වස්, උදව් උපකාර කරන්නවුන් නොසිටින්නට උගහට කරුණකි. මේ සඳහා අපහට එකී මාවත සකස් කර දුන් අය මෙන්ම අත්වැල් සැපයූ අය බොහෝය. එම සුදනන් කෘතවේදිව සිහිපත් කිරීම යහදන යුතුකමක් සේ අප පිළිමනින්නෙමු.

අපගේ ශාස්ත්‍රෝන්නතිය නිරන්තරයෙන් පතන මෙම අධ්‍යයනයේදී අවශ්‍ය උපදෙස් දී යා යුතු මග නොමග පිතෘ සෙනෙහසින් යුක්තව කියා දී මා මෙහෙය වූ මාගේ උපදේශකවරයාණන් වන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිංහල හා ජනසන්නිවේදන අධ්‍යනාංශයේ ජ්‍යෂ්ඨ මහාචාර්ය තිස්ස කාරියවසම් ගුරු පීතෘන් භක්ති ප්‍රණාමයෙන් පළමු කොටම සිහිපත් කළ යුතුව ඇත. එතුමාගේ දිරිගැන්වීම් මෙම අධ්‍යයනයෙහි අවශ්‍යතාව මසිත තීව්‍ර කරන්නට මහත් බල ප්‍රවාහයක් විය. එහෙයින් නැවත නැවතත් අපගේ ගෞරව සම්ප්‍රයුක්ත ප්‍රණාමය එතුමන් වෙත පුද කර සිටින්නෙමු.

සාමාන්‍ය බෙර වාදකයෙකු හෝ නර්තකයෙකු වී ප්‍රායෝගික පක්ෂය තුළ නිමග්නව සිටි මා හට ශාස්ත්‍රීය ලෝකයේ අඳුර, එළිය පිළිබඳ යථා ස්වභාවය වටහා දෙමින් වසර දොළහකට අධික කාලයක් තිස්සේ දුන් උපදෙස්, මෙතෙක් අප ආ ගමන් මගට මහත් පිටුවහලක් විය. ඒ අන් කවරෙකුවත් නොව වත්මන් සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ නව නර්තන හා නාට්‍ය අධ්‍යයනාංශ ප්‍රධාන මහාචාර්ය මුදියන්සේ දිසානායක ගුරු පීතෘහු ය. මෙම අධ්‍යයනයෙහි දී අපව දිරිමත් කරමින් පර්යේෂණ ක්ෂේත්‍රයේත්, මෙම නිබන්ධිතාවෙහිත්, ඇති වටිනාකම් පසක් කර දෙමින් නිරන්තරයෙන් සෙවනැල්ලක් මෙන් අප පසුපසින් සිටින එතුමන් සිහි කරන්නේ හද පිරි ගෞරව සම්ප්‍රයුක්ත සොම්නසින් යුතුව ය.

සේවයට පිවිස ඉතා කෙටි කාලයක් තුළ පුරා දෙවසරක දේශීය අධ්‍යයන නිවාඩු කාලයක් ලබාදීමට කටයුතු කළ සහ මෙම ප්‍රයත්නය වෙනුවෙන් අපව දිරිගැන්වූ කොළඹ විශ්වවිද්‍යාලයේ හොරණ ශ්‍රීපාලි මණ්ඩපයේ මණ්ඩපාධිපතිව සිටි මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක විද්වතාණන් මෙහි ලා ස්තුති පූර්වකව සඳහන් කරනු කැමැත්තෙමි. එමෙන්ම එකී කටයුත්ත ඉදිරියට පවත්වාගෙන යාමට රාජකාරිමය වශයෙන් මහත් ධෛර්යයක් සැපයූ, පර්යේෂණ කටයුතුවල අවශ්‍යතාවය පසක් කර දුන් අප විශ්වවිද්‍යාලයේම වත්මන් මණ්ඩපාධිපති ඩබ්ලිව්.එන්.විල්සන් විද්වතාණන් ද මෙහි ලා කෘතවේදිව සිහිපත් කරන්නෙමු.

අපගේ අධ්‍යයන කටයුතුවල දී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ මහාචාර්ය ආරියපාල පෙරේරා, සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශයේ මහාචාර්ය ධම්මික ගංගානාත් දිසානායක, මහාචාර්ය විමල් විජේරත්න, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුනිල් ආරියරත්න, මහාචාර්ය වන්දිම විජේබණ්ඩාර, ආචාර්ය කිවුලේගෙදර නාරද හිමි යන විද්වතුන් අප වෙත ඉතා සද්භාවයෙන් දක්වන ලද ශාස්ත්‍රීය මෙහෙවර කෘතඥතා පූර්වකව සිහිපත් කරමු.

ලිවීමේ දී, බස හැසිරවීමේ දී නිවැරදි භාවයට අවශ්‍ය උපදෙස් ලබා දෙමින්, නිබන්ධයේ වියරණ දොස් නිදොස්කොට, පුත්‍ර ස්නේහයෙන් කවදත් අප වෙත අවවාද අනුශාසනා කරන සිතා කාරියවසම් මැතිනිය සිහිපත් කරන්නේ ගෞරවනීය ස්තුති පූර්වකව ය. පර්යේෂණ කාර්යයයේ දී අදාළ විෂය ක්ෂේත්‍රයෙහි ස්වභාවය අනුව අවශ්‍ය ප්‍රායෝගික මෙන්ම සෛධාන්තිකව ඇති වූ ගැටලු නිරාකරණය කර දෙමින් කටයුතු කළ කොළඹ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ ආචාර්ය ලයනල් බෙන්තරගේ සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ශ්‍රීයාණි රාජපක්ෂ, අපගේ ගුරුවර විද්වතුන් මෙහි දී සිහිපත් කරනුයේ හදපිරි සෙනෙහසිනි.

විෂයානුබද්ධ දැනුම සහ ඊට අදාළ පොතපත හඳුන්වා දෙමින් උදව් උපකාර කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය ටෙනිසන් පෙරේරා, ආචාර්ය ප්‍රණිත් අභයසුන්දර විද්වතුන් මෙන්ම ගාල්ල සදර්න් පෞද්ගලික රෝහලේ මනෝ වෛද්‍ය විශේෂඥ ඩී.වී.ජේ. හරිශ්චන්ද්‍ර මහතා අපහට කළ ශාස්ත්‍රීය උපකාරවලටත්, සබරගමු පළාත් සභාවේ නැටුම් කණ්ඩායම භාර පී.වී. අබේරත්න මහතාට ද ස්තුතිය පුද කර සිටිමි. ඒ අතරම අවශ්‍ය පොත්පත් සහ ලේඛන ගත තොරතුරු පරිශීලනය කිරීමට ඉඩහසර සලසාදුන්, කොළඹ ජාතික කෞතුකාගාර පුස්තකාලය, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ කොළඹ ප්‍රධාන ශාඛාව සහ නුවර උප ශාඛාව, ජාතික පුස්තකාලය, මහජන පුස්තකාලය, කෑගල්ල කච්චේරිය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව යන ස්ථානයන් හි පුස්තකාල ආයතනවල ප්‍රධානීන් ඇතුළු කාර්ය මණ්ඩලවල සියළු නිලයන්ට ද මාගේ ස්තුතිය පුද කර සිටිමි.

මේ තාක් පාරම්පරික සබරගමු නැටුම් ශිල්පය සහ යක් තොවිල් ආශ්‍රිත වතාවත්, දුක් ගැහැට මැද අභාවයට යා නොදී පවත්වාගෙන ආ අපහට පුස්කොළ පොත්, අත් පිටපත් ආදිය පරිශීලනය කිරීමට පමණක් නොව ඒවායෙහි ප්‍රායෝගික අංශවල ඇති කරුණු නොවලහා කීමට තරම් උත්සුක වූ රත්නපුර දම්බුළුවන ඩී.එම්. පුංචිකිරා, හල්පෙ ඇම්.ඩබ්ලිව්. පොඩි සිංඤෝ, ඇම්.ඩබ්ලිව්. ජේම්ස්, ඇම්.ඩබ්ලිව්. ගුණපාල යන ඇදුරන් ද, යටියන්තොට ඩී.එච්. පොඩිඅප්පුහාමි, ආර්.ඇම්. පොඩිනිලමේ ද රුවන්වැල්ල, මුදුගමුව කේ.කේ. පීටර් අප්පුහාමි, ගොඩගම්පල එස්.කේ. පියසේන, හිඳුරංගල පොඩිඅප්පුහාමි යන ඇදුරුතුමන්ලාත් සියළු යක් තොවිල් ශිල්පීන් මෙන්ම දත්ත දායකයන් වශයෙන් උදව් උපකාර කළ සියලු තරාතිරම්වල හිතවතුන් ද ඉතාමත් ගෞරවයෙන් යුතුව සිහිපත් කර සිටිමි.

අපගේ අභිවෘධිය නිරන්තරයෙන් ප්‍රාර්ථනා කරන මෙම කටයුත්තේ දී ඇදුරන් හඳුන්වා දෙමින් ආහාරපාන සපයමින් අපරිමිත උදව් උපකාර කළ කොළඹ

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ බාහිර උපදේශකවරයෙකු වන පී.ඇම්. බබානිස් මහතාට ද අපගේ ගෞරවනීය කෘතඥතාව පුද කරමි.

මාගේ අධ්‍යයන කටයුතු දෙස බලා නිරන්තරයෙන් ආශිර්වාද කරන, ශක්තිය පතන, සදාදරණීය අම්මා සහ මෙලොවින් සදහටම සමු ගත් පියාණන් ද හදපිරි භක්තියෙන් සිහිපත් කරමි. පියාණන්ට පිං දෙමි. එපමණක් ද නොව මාගේ මෙම පර්යේෂණ කාර්යයයේ දී අත්පිටපත් සියල්ල පැහැදිලි අත් අකුරින් ලියමින් සැමියකුගෙන් විය යුතු යුතුකම් ද අත පසුවන විට ඉවසා දරා, මාගේ සියලු කටයුතුවල දී මා පසුපසින් සිටින ම'පියඹ රංගා ද මෙහිලා ආදරයෙන් සිහිපත් කරමි. මතු නොව පැහැදිලි අත් අකුරු ලියා දෙමින් නිරන්තරයෙන් මා දිරිමත් කරන කුලියාපිටියේ අම්මා, අප්පච්චි පමණක් නොව චූටි අයියා, අක්කා, බින්දු සෙනෙහසින් සිහිපත් කරමි. එසේම අපගේ ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතුවල දී ඈදුරන් සොයා යන ගමනේ මා හට ධෛර්යයක් වූ නංගී සහ රවින්ද්‍ර මල්ලි සෙනෙහසින් සිහිපත් කරමි.

ඉතා දුර බැහැර දුෂ්කර ප්‍රදේශවල මා හා අනේකවිධ දුක් දොම්නස් සම සිතින් විඳ ගනිමින් ඔවුන් කරා මා රැගෙන යමින් මා හට සහය දුන් සවිත්‍ර, ශාලික, සමීර, පැතුම් යන මල්ලිලා ද ඇතුලත චිත්‍ර දළ සටහන් ඇඳ දුන් වසන්ත කුමාර මල්ලී, රංගා සඳමාලී මෙහිලා කෘතවේදීව සිහිපත් කරමි. මෙතෙක් මා විසින් සොයා සපයා ගන්නා ලද කරුණු ලේඛනගත කිරීමෙන් අණතුරුව, නිබන්ධිකාවක් බවට පත් කිරීම උදෙසා පරිගනක අකුරු ඇසුරුම් කළ ලොකුගමගේ මහතාට ද මෙහි දී ස්තුති පූර්වක ප්‍රණාමය පුද කරනු කැමැත්තෙමි.

# පටුන


උපකාරානුස්මෘත I-IV

පටුන V-VII

අන්තර්ගතය VII-X

සංක්ෂේපණ XI-XIII

**පළමුවන පරිච්ඡේදය**

**හැඳින්වීම**

1.1 සබරගමු පළාත 1-2

1.2 ජනගහනය සහ ජන ජීවිතය 2-5

1.3 විෂයගත පසුබිම 5-17

1.4 පර්යේෂණ ක්‍රම වේදය 17-36

1.4.1 මූලාශ්‍රය අධ්‍යයනය

(අ) මහාවංශය

(ආ) ආගමික මූලාශ්‍රය

(ඇ) ආයුර්වේදීය මූලාශ්‍රය

i) සුශ්‍රැත සංහිතා

ii) චරක සංහිතා

iii) ශාර්ඞගධර සංහිතාව

iv) පඤ්ච නිධාන

v) ස්ත්‍රී චිකිත්සාවලිය සහ කාම රෝග දර්ශනය

(ඈ) යක් තොවිල් මූලාශ්‍රය

1.4.2 ක්ෂේත්‍ර අධ්‍යයනය / ප්‍රත්‍යක්ෂ අධ්‍යයනය 31-36

(අ) යක් තොවිල් නිරීක්ෂණය

(ආ) සම්මුඛ සාකච්ඡා

**දෙවන පරිච්ඡේදය**

**සබරගමුව පළාතේ ශාන්තිකර්ම** **37**

2.1 යක් තොවිල් හා බැඳි ඇදුරු පරම්පරා 38-43

2.2 ජන ආගම සහ ශාන්තිකර්ම 43-48

2.3 යක්ෂ විශ්වාසය සහ යක් තොවිල් 48-66

සන්නි යකුම-කුමාර සමයම- කඩවර කාරිය-

මහ සොහොන් සමයම -දෙහි තොවිලය - වැදි තොවිලය

**තුන්වන පරිච්ඡේදය**

**ලිංගික අධ්‍යයනය හා එහි සමාජ මුහුණුවර** **67**

3.1 ලිංග / ලිංගිකත්වය අර්ථ නිරූපණය කිරීම 67-74

3.2 ලිංගිකත්වය පිළිබඳ ප්‍රාථමික විශ්වාස 74-88

3.3 සිංහලයන්ගේ ලිංගික පසුබිම 88-94

3.3.1 විවාහය 94-100

3.3.2 ප්‍රජනන ක්‍රියාවලිය 100-105

3.4 ලිංගාශ්‍රිත ව්‍යාධි 105-119

3.5 ලිංගිකත්වය පිළිබඳ බෞද්ධ විග්‍රහය 119-133

3.5.1 ලිංග සංකේතය සහ කප 133-138

**සිව්වන පරිච්ඡේදය**

**යක් තොවිල්වල චත්පිළිවෙත් හා ලිංගික නිරූපණ** **139**

4.1 ලිංගිකත්වය නිරූපණය කෙරෙන යකුන් 140-145

4.1.1 කළු කුමාර 145-150

4.1.2 කළු යකා 150-154

4.1.3 මදන යකුන් / යක්ෂණියන් 154-163

4.1.4 තොට යක්ෂයා 163-167

4.1.5 සන්නි යකුන් 167-171

4.1.6 කඩවර යකු 171-173

4.1.7 රීරි යක්ෂයා 173-183

4.2 සංවාදවලින් හෙළි වන ලිංගික නිරූපණ 183-188

4.2.1 පොක්කඩේ යක්කම / පාළිය 188-207

සන්නි යකුම 207-225

4.3 චලනවල ලිංගික නිරූපණ 225-231

4.4 සැරසිලි හා රංග භාණ්ඩ ආශ්‍රිත ලිංගික නිරූපණ 231-240

**සමාලෝචනය** **241-244**

**චිත්‍රාවලිය** **245-249**

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය** **250-270**

# අන්තර්ගතය

සබරගමු පළාත සහ එම පළාතේ ගම්වල පාරම්පරිකව පැවතගෙන ආ යක් තොවිල් ද ඒවායෙහි අන්තර්ගත චාරිත්‍ර වාරිත්‍රවලින් ප්‍රතීයමානිත ලිංගික නිරූපණ පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණ නිබන්ධයේ මූලික අභිප්‍රාය යි. එහි දී ඒ ගැන සිව් පරිච්ඡේදයකින් පුළුල්ව සාකච්ඡා කිරීමෙන් අනතුරුව සමස්ත නිබන්ධයම සම්පිණ්ඩනය කොට ගෙනහැර දක්වා ඇත.

මානවයාගේ ආරම්භක යුගයේ සිට ම ලිංගිකත්වය, මානසික සහ ප්‍රායෝගික වශයෙන් නිත්‍ය ක්‍රියාකාරකමක් මෙන් ම නව අත්දැකීම්වලට භාජනය වෙමින් විකාශනය වූ අතර, එකී ක්ෂේත්‍රය ගැමි ආගමික සංකල්ප තුළට ද කිඳා බසිනා ලදින්, ලිංගිකත්වයට අධිගෘහිත යකුන් යක්ෂණියන් ඇතැයි සලකා ඒ වෙනුවෙන් පුද පූජා පැවැත්වීමේ යක් තොවිල් සම්ප්‍රදායක් විය. එහි ලා මෙම අධ්‍යයනයට පාදක කර ගන්නා ලද්දේ උඩරට පහතරට යක් තොවිල් සම්ප්‍රදායයන් අතුරින් සබරගමු යක් තොවිල් සම්ප්‍රදාය යි. මන්ද ඒ වූ කලී මෙතෙක් ඈදුරන් අතරේ පමණක් ව්‍යවහාරික වූවා මිස ශාස්ත්‍රීයමය ලේඛන ගත කිරීමේ ප්‍රාමාණික අධ්‍යයනයක් මෙතෙක් සිදු නොවීම නිසා ය. එහි දී අප පළමුවැනි පරිච්ඡේදය වෙන් කරන ලද්දේ මූලිකව සබරගමු පළාත හඳුන්වා, රත්නපුර සහ කෑගල්ල යන දිස්ත්‍රික්ක දෙකෙහි ජනගහනය-ජන ජීවිතය පිළිබඳවත් තොරතුරු ඉදිරිපත් කිරීමට යි. එපමණක් ද නොව මෙම පර්යේෂණයේ හැඳින්වීමටත්, පර්යේෂණය ගොඩ නැඟීම සඳහා උපස්ථම්භක වූ මූලාශ්‍රය ඇගයීමත් සඳහා ය. ඊට විෂය ගත පසුබිම මූලික වූ අතර, දෙවනුව පර්යේෂණයේ ස්වභාවය අනුව, ඊට අදාළ වන ඒ ඒ ක්ෂේත්‍රවලට අයත් ඓතිහාසිකමය සාහිත්‍ය මූලාශ්‍රය කෘතීන් කිහිපයක විස්තර ඉදිරිපත් කර ඇත. ඊට අමතරව ආයුර්වේදීය මූලාශ්‍රය, යක් තොවිල් මූලාශ්‍රය කෘති පිළිබඳව තොරතුරු සඳහන් කෙරිණි. අනතුරුව පුස්කොළ පොත්, අත්පිටපත් ආදී මූලාශ්‍රයවලට අමතරව

ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතුවල දී නැරඹූ තොවිල්, කළ සම්මුඛ සාකච්ඡා ආදිය ද පළමු පරිච්ඡේදයට අන්තර්ගත කෙරිණි.

දෙවන පරිච්ඡේදයෙන් සබරගමු පළාතේ ශාන්තිකර්ම යන්න ප්‍රධාන තේමාව කරගත් අතර යථෝක්ත පළාතෙහි ශාන්තිකර්ම වර්ගීකරණය කිරීමටත්, යක් තොවිල් පිළිබඳ විග්‍රහ කිරීමත් මෙහි අඩංගු ය. තොවිල් පවත්වාගෙන ආ ඇදුරු පරම්පරා පිළිබඳ, ප්‍රාදේශීය වශයෙන් ඇති වෙනස්කම් අනුවද කරුණු සාකච්ඡා කළ අතර ජන ආගම සහ ශාන්තිකර්ම, යක්ෂ විශ්වාසය, යක් තොවිල් පිළිබඳවත් විග්‍රහයක් ඉදිරිපත් කෙරේ.

මෙම නිබන්ධිකාවෙහි තෙවන පරිච්ඡේදය, ලිංග අධ්‍යයනය පිළිබඳව විවරණයටත්, එහි සමාජගත මුහුණුවර පිළිබඳවත් යන කරුණු විග්‍රහ කිරීමට වෙන්කොට ඇත. එහි දී ලිංග යන පදයෙහි අර්ථ නිරූපණය කිරීම, ලිංගිකත්වය හා සම්බන්ධව ගොඩ නැගී ඇති ප්‍රාථමික විශ්වාස පිළිබඳව ද විග්‍රහ කර තිබේ. එපමණක් ද නොව එදා මෙදා තුර සිංහල සමාජයේ සාමාජිකයින්ගේ ලිංගික ක්‍රියාවිලාස පිළිබඳ පසුබිම, ලිංගාශ්‍රිතව ඇති වන ව්‍යාධි, ඒවා යක් තොවිල්වලට බලපාන ආකාරය යන කරුණු විග්‍රහ කර ඇත. ලාංකේය සමාජ සන්දර්භය මතුයෙහි ප්‍රධාන ආගම වන බෞද්ධ දර්ශනය අනුව, බුදුන් වහන්සේගේ ඉගැන්වීම්, පෙන්වාදීම් ඇතුළත් දේශනාවන් පෘථක්ජන ජීවිතය වියෂයෙහි ගිහි පැවිදි දෙපක්ෂයට බලපාන ආකාරය පිළිබඳව සංසන්දනාත්මකව විග්‍රහ කර ඇත. ලිංග සංකේතය පිළිබඳව වඩාත් වැදගත් වන "කප" පිළිබඳවත් මෙහි කරුණු විග්‍රහ කර ඇති අතර, හින්දූන්ගේ ප්‍රධාන ලිංග සංකේතය වන ශිව ලිංගය අතර සම්බන්ධතාවය පැහැදිලි කෙරේ.

සිව්වැනි පරිච්ඡේදය වෙන් වන්නේ ඍජුවම සහ වක්‍රව සබරගමු පළාතේ යක් තොවිල්වල නිරූපණය වන ලිංගිකත්වය පිළිබඳව විග්‍රහ කිරීම සඳහා ය. එහි දී අප විසින් එම යක් තොවිල්වල ලිංගික නිරූපණයන් ප්‍රකට කෙරෙන චාරිත්‍ර

අංග පිළිබඳ වෙන් වෙන් වශයෙන් වන ක්ෂේත්‍ර යටතේ කළ විග්‍රහයක් ඊට අයත් වෙයි. ලිංගිකත්වයට අධිගෘහිත යකුන් සහ ඔවුන්ගේ උපත් කථා; මෙන්ම සබරගමු යක් තොවිල්වල ප්‍රධානව පුද ලබන අනෙකුත් යකුන් ලිංගික පක්ෂයට වඩා මිනිසුන් වෙත බලපෑම් කරන්නේ කෙසේදැයි පැහැදිලි කෙරේ. ඇදුරන් අතර තොවිල්වල දී ඇති වන සංවාද ඇතුළත් නාට්‍යමය අවස්ථාවල ලිංගික නිරූපණ සහ චලනවල අභිනයාත්මක නිරූපණ පමණක් නොව සැරසිලි සහ රංග භාණ්ඩ ආශ්‍රිතව නිරූපණය කෙරෙන ලිංගිකත්වයේ ස්වභාවය යන ශීර්ෂ යටතේ කරුණු විග්‍රහ කිරීමට මෙම පරිච්ඡේදය යොදා ගෙන ඇත. මේ සියල්ල සබරගමු ගැමි ජනයාට වඩා සමීප වන ආකාරයත් මේ කරුණු තුළින් මතු කර දක්වා ඇත.

## සංක්ෂේපණය

| | | |
|---|---|---|
| අ. ච. | - | අසාමාන්‍ය චර්යා |
| අ. ඉ | - | අසිරිමත් ඉන්දියාව |
| උ. ශා. ගැ. නා. ස. | - | උඩරට ශාන්තිකර්ම හා ගැමි නාට්‍ය සම්ප්‍රදාය |
| ඓති. භෞ. ක. | - | ඓතිහාසික භෞතිකවාදය හා කලාව |
| ක. දෙ. | - | කතරගම දෙයියෝ |
| ක. යා. පි. | - | කළුකුමාර යාග පිළිවෙළ |
| ක. පු. දා. ව. | - | කළුකුමාරයා පුද ලබන දාරක වත් පිළිවෙඩ |
| කං. ගී. සා. | - | කංකාරි ගීත සාහිත්‍යය |
| කො. යක්. කා. ස. ස. | - | කොහොඹා යක් කංකාරිය සහ සමාජය |
| කෞමාර. | - | කෞමාරභෘත්‍යය |
| ඛු. නි. | - | ඛුද්දක නිකාය |
| ච. සං. | - | චරක සංහිතාව |
| දු. අ. ස. වි. | - | දහ අට සන්නි විග්‍රහය |
| ධ. සිං. ශ. කෝ. | - | ධර්මසමය සිංහල ශබ්ද කෝෂය |
| න. වා. කෝ. | - | නර්තන වාක් කෝෂය |
| නි. වා. | - | නිරුවත් වානරයා |
| නො. දු. ල. | - | නොක්ස් දුටු ලක්දිව |
| ප. නි. ග්‍ර. | - | පඤ්ච නිදාන ග්‍රන්ථය |
| පා. සිං. ශ. කෝ. | - | පාලි සිංහල ශබ්ද කෝෂය |
| පැ. ල. කා. | - | පැරණි ලක්දිව කාන්තාවෝ |
| ප්‍රී. වි. ජී. | - | ප්‍රීතිමත් විවාහ ජීවිතය |
| ප්‍රා. සිං. ශ. කෝ. | - | ප්‍රායෝගික සිංහල ශබ්ද කෝෂය |
| බ. ගු. උ. ප්‍ර. | - | බබානිස් ගුරු උපහාර ප්‍රණාම |
| බ. පි. | - | බලියාග පිළිවෙළ |